තල්, පොල් සහ මුතු පබා - 19

# බ්‍රිතාන්‍ය සංචාරකයා කුතුහලයට පත් කළ ආදම් ගේ කන්ද - 6

ශ්‍රියා කුමාරසිංහ - නවසීලන්තයේ සිට

කඳු මුදුන අණ්ඩාකාරය. අඩි පහක් උස බැම්මකින් වටවී ඇති සුළු ඉඩ ප්‍රමාණයේ නැගෙනහිර සිට බටහිරට ඇති දුර අඩි අසූවක් පමණ වේ. හරි මැද අඩි දහයක් පමණ උසැති අඩි එකසිය විස්සක වට රවුමක් ඇති ඉහලට නෙරා ගිය ගල් කුළකි. මේ ගල් කුළ මත අඩි හයක් දිගට අඩි දෙකහමාරක් පළලට ගල ඇතුලට නෙරා යන පරිදි තැන්පත්ව ඇති බෞද්ධ කල්පිතයට අනුව ගෞතම බුදුන්ගේ සිරිපා සළකුණ වේ.

ඕනෑම කෙනෙකුට පැහැදිළිව පෙනෙන ආකාරයට එය බදාම තට්ටුවක් මත ඔබ්බවන ලද මුද්‍රාවකි. මනුෂ්‍ය පාදයක් ලෙස යාන්තමට පෙනේ. ඉබන් බැටිස්ටා ට අනුව චීන ජාතිකයින්ගේ මංකොල්ල කෑමට ලක් වූ එහි විශාල ඇඟිලි දෙක කපා ගෙන ගොස් ෂු තොන් නම් වු චීන නගරයක තැන්පත් කර ඇතැයි කියති. විශාල වශයෙන් වන්දනාකරුවන් ඇදී එන කාලයට ස්ථානය භාර හිමි නම මෙම පා සළකුණ මත ස්වභාවික ගලින් වටවී ඇති ආකාරයක් පෙන්නුම් කෙරෙන එහෙත් බදාම යොදා සවි කොට ඇති මැණික් එබ්බවූ පිත්තල රාමුවක් තබා එය ආවරණය කර තබයි. වර්ණවත් වීදුරුවකට වැඩි මනත් යමක් ලෙස එය නොපෙනේ. පා සළකුණ පිහිටි ස්ථානයේ කර ඇති කැණීමද අඩක් ස්වභාවික, අඩක් කෘතීම එකක්දැයි සැකයක් මතු වේ. සුළු වශයෙන් නෙරා ගිය ඇඟිලිවල කුඩා කුහරයන්ද කෙනෙකුගේ නිර්මාණයක්දැයි සිතෙන තරම්ය. මන්ද යත් ඒවා කළුගල්වලට වඩා වෙනස් ද්‍රව්‍යයකින් නිමවී ඇති බැවිනි. ශ්‍රී පාදයට ඉහලින් දැවයෙන් තැනූ කුඩා විවෘත පන්සලකි. එය

## සදා නොනැසෙන සිද්ධස්ථානය

රන්සිවිගෙය යනුවෙන් හැඳින්වේ. අඩි දොලහ සහ අඩි දහය යන දිග පළලින් යුතුය. එය රඳවා ඇත්තේ යකඩ දම්වැල් හතරකිනි. එහි උළු සෙවෙලි කල උඩු වියනට ආධාරකයන් ලෙස කැටයම් කල ලී කණු හතරක් තබා ඇත. වන්දනාකරුවන්ගේ නම්වල මුලකුරුවලින් එම කණු වල කැටයම් මුළුමනින්ම පාහේ වැසී ගොසිනි. ස්විස් ගොඩනැගිල්ලක් මෙන් පෙනෙන මෙම කුඩා ගොඩනැගිල්ල උත්සව සමයට සුදු හෝ වර්ණවත් රැළි පාලම් වලින් සරසා හාත්පස මල් අතුරති.




සෑහෙන දුරක් මග ගෙවා මෙතැනට පැමිණෙන වන්දනාකරුවන් පළමු කොටම සිරිපා සළකුණට පහතින් ඇති අඩි තුනක පමණ උසට තනා ඇති සමන් දේවාලයට ගොස් බිම දිගාවී සිය ප්‍රණාමය පුද කරති. ඊන්පසුව ලම්බාකාර ගල් කණු දෙකක් මත තවත් ගල් කණුවක් හරහට තබා එහි සවිකර ඇති ඝණ්ඨාරය වෙත යති. එක් එක් වන්දනාකරුවා බැගින් වෙන වෙනම ඝණ්ඨාරයේ ගැට ගසා ඇති සමින් කළ කඹයෙන් අදිති. එමගින් සීත ගඟුලෙන් නා පිරිසිදු වීමෙන් පසු ඉටු කලයුතු සියළු වතාවත් නිසි පරිදි ඉටු කර ඇද්දැයි සනාථ කර ගනිති. සියල්ල නොපෙහෙලා ඉටු කර ඇත්නම් ඝණ්ඨාරයෙන් විශාල හඬක් පිටවේ. හඬ පිට නොවුණි නම් ඝණ්ඨාරය සිය තීන්දුව ප්‍රකාශ කිරීම ප්‍රතික්ෂේප කල බවකි. ඒ අනුව වන්දනාකරුවා තමා අතින් මග හැරුණු පිළිවෙත් ඉටු කරන තෙක් ඉන් ඔබ්බට ඇති වතාවත් නිම කිරීමට නුසුදුස්සෙකු වේ.

අළුත් අවුරුදු මංගල්ලයකදී මෙන් වරකට හාරසියයක් පන් සියයක් බැගින් වන්දනාකරුවෝ කඳු මුදුනට රැස් වෙති. ඉහත කී සියළු වතාවත් නිම කිරීමෙන් පසු කඳු මුදුනේ මැද පිහිටි කුඩා ගල් කුල පාමුල දණ ගසා සිපාචාර පවත්වති. එසේ වන්දනා කරන අතර තඹ කාසි හෝ රෙදි පිරුවට, වර්ණවත් රොඩො-ඩෙන්ඩ්‍රන් මල් පොකුරක්, මිහිරි සුවඳැති පිච්ච මල් අහුරක්, නොපිදුණු පුවක් මලක්, හෝ අඩු තරමින් බුලත් කොලයක් දෙකක් සිරිපා පතුලේ ඇඟිලි තුඩු අසලින් තබති. රනින් කල හෝ මුතු මැණික් වලින් සැරසු වටිනා පුද පඬුරු ගෙන එන වන්දනාකරු-වන්ට පමණක් ගල් පඩි දහයක් උසින් පිහිටි පන්සලට ඇතුළු වීමට අවසර ලැබෙන අතර එහිදී ඔවුන්ට නියම සිරිපා පතුල මත තබා ඒවා පූජා කිරීමට අවස්ථාව සැලසේ. ඒ සැනෙකින්ම එහි සිටින හිමි නමක් විසින් එම වටිනා පූජා භාණ්ඩ ශ්‍රී පාද ස්ථානය භාර පූජක තුමාගේ පෞද්ගලික භාණ්ඩාගාරයට යවනු ලැබේ. ඉන්පසු ආගමික තේවාවක් සිදු කරයි. කසාවතින් සැරසුණ පූජක වරයෙකු සිරිපා සළකුණ ආසන්නයේ සිට එදෙසට මුහුණ ලා දණ ගසාගෙන දොහොත් මුදුනේ තබා වැඳ නමස්කාර කර සිටින වන්දනා කරුවන් දෙස බලාගෙන කිසියම් වන්දනා පාඨයක් වැකියෙන් වැකිය උස් හඬින් කියයි. වන්දනාකරුවෝ ඊට ප්‍රතිචාර දක්වති. නොකඩවා සාදුකාර දෙති. ඉන්පසුව රැස්ව සිටින සියල්ලෝම එකිනෙකාට ආචාර පවත්වති. කෙස් පැහුණු වයස්ගත කාන්තාවක් ඒ හා සමාන ගාම්භීර පෙනුමක් ඇති පුද්ගලයෙකුගේ පාමුල දණ ගසා දෙපා වඳී. කුමන හාස්කමකින් ඇය මෙතෙක් දුර මේ කඳු මුදුනට ආවාදැයි මට තේරුම් ගත නොහැකි ය. බුහුමන් ලද තැනැත්තා ඇය නගා සිටුවයි. ඉන්පසු

*ඕනෑම කෙනෙකුට පැහැදිළිව පෙනෙන ආකාරයට එය බදාම තට්ටුවක් මත ඔබ්බවන ලද මුද්‍රාවකි. මනුෂ්‍ය පාදයක් ලෙස යාන්තමට පෙනේ. ඉබන් බැටිස්ටා ට අනුව චීන ජාතිකයින්ගේ මංකොල්ල කෑමට ලක් වූ එහි විශාල ඇඟිලි දෙක කපා ගෙන ගොස් ෂු තොන් නම් වු චීන නගරයක තැන්පත් කර ඇතැයි කියති.*

ඔවුන් දෙදෙනාම තරුණ පිරිස දෙසට හැරී ඔවුන්ගේ ආචාර පිළිගනිති. සියල්ලෝම එකම පොදියක් ලෙස බුලත් විට හුවමාරු කර ගනිමින් පවුල් සබඳතා, නෑ සිය මිතු දම් තර කර ගනිති. ඉන්පසු නැවත වරක් ගල් කුල වටා රැස්ව ආශිර්වාද ලබා ඝාණ්ඨාරය හඬවා, උතුරු දෙසින් පිහිටි කුඩා උල්පතකින් දිය උගුරක් බී, වඩා යහපත් ධාර්මික ජීවිත ගත කරනු වස් ආපසු පහත් බිම් බලා පිටත් වෙති.

මම වරක් මේ ආසන්නයේ ඇති, මීට වඩා තරමක් උසින් වැඩි පිදුරුතලාගල කඳු මුදුනේ රැයක් ගත කළෙමි. ශ්‍රීපාද කන්ද ගැන මේ ඔබට කියන ආකාරයෙන්ම එම කඳු මුදුනේදී මා ලැබූ අත්දැකීම්ද කියනු කැමැත්තෙමි. දල්වා තිබූ ගිනි මැලයේ අවසාන ගිනි දළුවද ක්‍රමයෙන් මැකී ගිය පසු නොබෝ වේලාවකින් මා නින්දට වැටුණි. හමා ගිය සීත සුළඟක් විසින් මා ඇහැරවනු ලැබීය. අපගේ පරිහරණයට තනා තිබූ කුඩා පැල එහි සිදුරු තුලින් ඇතුළු වූ සුළඟේ සිවුරුහන් හඬින් ගීතවත් වීය. අධික සීතලක් දැනුනෙන් මා පැලෙන් පිටතට ගොස් එහාට මෙහාට ඇවිදිමින් ගත උණුසුම් කර ගැනීමට උත්සාහ කළෙමි. මම සිටියේ අක්ෂාංශක දශම 5 ආසන්නයේ බව සැබෑවක් නමුත් එය මුහුදු මට්ටමේ සිට අඩි අටදහසක් උසින් පිහිටි තැනක් බව අමතක නොකළ මනාය. තරමක් වේලා මගේ නෙත් පියන් නිදිමතින් බරවී තිබුණද ඒ කාලය නිදිවරා එළිමහනේ ගත කිරීම පිළිබඳව මම කිසි දිනෙක පසුතැවිලි නොවෙමි. මන්ද යත් එසේ සිටීමට තිරණය කිරීම නිසා එම වළාකුළු අඩවියේ සිට ඊට මොහොතකට පසුව මට දැකගත හැකි වු ඉතාමත් ආශ්වාද ජනක දසුන් මගින් එම අපහසුව මකා දමනු ලැබූ හෙයිනි.

එය පුර පසලොස්වක දිනයට ආසන්න දිනයකි. සඳ එළියෙන් අවට කඳුවල ඡායාව ඉතා පැහැදිලිව දැක ගත හැකි විය. එමෙන්ම ආසන්නයේ ඇති සියළු හිස් අවකාශයන් හා ඇලි කඳුරු විනිවිද නොපෙනෙන ඝණ අඳුරු සෙවනැලි වලින් වැසී සිතා ගත නොහැකි තරමේ ගැඹුරක් මවා පෑවේය. අළු පැහැති මුතු පබළු මෙන් දිස් වූ විස්මිත හැඩතල වලින් සුසැදි මීදුම් පොදි එහාටත් මෙහාටත් පාවෙමින් තිබුණි. වරින් වර ඒ තුලින් මිදී ආ කුඩා වළාකුළු කැබැල්ලක් ඔහේ නිදැල්ලේ පාවෙමින් හුදකලා ගවේෂණ චාරිකාවක යෙදුණි. ඉන් මොහොතකට පසු දක්නට ලැබුණේ අපූර්වතම දර්ශනයකි. නිදි වැරූ රාත්‍රිය විසින් එතෙක් බලෙන් රඳවා ගෙන සිටි වළාකුළු හමුදාවක් උසට නැගී සිටින කඳු මුදුන් බාධක වල ගැටෙමින් පුළුන් සේ සැහැල්ලු පෙණ පොදි මෙන් බිඳෙමින් එක් වෙමින් වේගයෙන් ගලා එන්නට පටන් ගති.එම දසුන දැකීමත් සමග අනාදිමත් කාලයක් තිස්සේ සිය ජන්ම භූමිය සුරකින මුර දේවතාවන් සිය රැකවල් ස්ථාන වලින් මෙසේ වාෂ්ප වී පිට වී යන්නේය යන මේ මගේ දෙපා අසල ගොරවමින් නිදා සිටින සාමාන්‍ය කුලී කරුවාගේ බොළඳ විශ්වාසය සැබෑවක් විය හැකි බව ප්‍රත්‍යක්ෂ කර ගැනීම එතරම් අසීරු කාර්'යයක් නොවීය.



සැණෙකින් සුළඟ නැවතී අරුණෝදය එළඹිණි. මහනුවර කඳුකරයට ඉහළින් විහිදුණු පළමු හිරු කිරණ හංස පෝතකයෙකුගේ ලැම පෙදෙස බඳු වර්ණයකින් දිලුණි. ගණනය කළ නොහැකි තරම් ඒකරාශී වූ කුඩා දූපත් සමුහයක් මෙන් වීදුරු ස්ථරයක් මත ජලය විසිරී යන ආකාරයෙන් හිරු රැස් හාත්පස විසිරී ගියේය. පිපාසිත හිරු දෙවියන් අබිමුවේ මීදුම්, සෙවනැලි, වළාකුළු සියල්ල ඒකරාශී වී වියැකී යනතුරු, පහත් බිමේ නැවත වරක් ගල් පර තුරු මුදුන් හා කඳු වැටි වල නිසල සේයා විද්‍යාමාන වන තුරු කෙනෙකු හොඳ සිහි කල්පනාවෙන් නොසිටියේ නම් මෙම මායාව සොබා දහමේ තවත් එක් චමත්කාරජනක නිමැ-වුමක් පමණක් බව වටහා ගැනීමට අපහසු වෙනු නිසැකය. වැඩි මනත් විස්තර නොකලද සිරිපා කඳු මුදුනේ සිට දකින්නට ලැබෙන දර්ශනයේ අසිරිමත් බව කෝර්සිකාවේ රොටොන්ඩෝ කඳු මුදුනේ සිට දකින දසුනට තරමක් දුරට සමානයයි, නැතහොත් ඊට වඩා දර්ශනීයත්වයෙන් ඉහල යයි කිව හැකිය. එහි සිට සෑම දෙසින්ම පෙනෙනුයේ,

පියවරෙන පියවර එසැවී
හරිත වර්ණයෙන් ගැවසී
කඳු මත ලෙළ දෙමින් වැජඹෙන
තුරු ලතා
සිතිජය තෙක් පැතිර
අඳුරේ ගැලී කිම්දෙන
නිමක් පතුලක් නොමැති
ගැඹුරු සෙවනැලි ඉතා

උතුරු හා ඊසාන දිග අහසට යාව පෙනෙන සෞම්‍ය වු මහනුවර කඳු රැල්ල, දකුණු හා බටහිර දෙසට ගලා යන පලාවන් තුරු ලිය, දැකුම් කළු ගල් පර්වත, අලස ලෙස බසින කඳු පල්ලම්, දිස්න දෙමින් කඩා හැලෙන දිය ඇලි, කුඩා දිය බුබුලක්ව මේ සා උස කඳු මුදුනින් පැන නැගී එක හුස්මට දිව ගොස් ඔබේ දෙපා මුල වැතිරී හති අරින, ඔබේ ඇසට පෙනෙන තෙක් මානයේ සැතපුම් ගණන් දිග තැනිතලා වන ගහන තුලින් ඇදී ගොස් පොල් රුප්පාවලින් වටවු මහ මුහුදට වදින ගංගා. මේ සියල්ල කැටි කොට ගත් සත්‍යය නම්,

නඳ දෙමින් රැලි නගන රිදීයෙන් බබලන
හිරු නෙත් පහස ලැබ කිරණින් බැඳ
තබන
සදා කල් රිසිවන ප්‍රමෝදිත නිවහන
සුලලිත රජ දහන අරුමැති විස්මලන්තය

සර් එමර්සන් ටෙනන්ට් එය වදන් වලට



"Adam's Peak" in Sri Lanka, with "1" marking the site of Adam's footprint on the summit

"This copper-plate print of Adam's Peak, was engraved for Antoine-François Prevost's monumental 25-volume edition of L'Histoire Generale des Voyages, published by Pierre de Hondt, The Hague between 1747 & 1780."